කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

නිවේදන අංකය : 06 WW/TC/19/04/27/06
වර්ණය : ඇම්බර්

# 'ෆොනී' සුළි කුණාටුව පිලිබඳ අවවාදාත්මක නිවේදනය

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින් 2019 අප්‍රේල් මස 27 වන දින සවස 05.00 ට නිකුත් කරන ලදී.

## දිවයිනට සහ දිවයිනට නැගෙනහිර, ගිනිකොණ සහ උතුරු දෙසින් වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශ සඳහා

සැලකිලිමත් වන්න!

ගිනිකොණ දිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ, ශ්‍රී ලංකාවට ගිනිකොණ දෙසින් පවතින ගැඹුරු පීඩන අවපාතය සුළි කුණාටුවක් ('ෆොනී') බවට පත් වී අද (27) පෙ.ව. 11.30 වන විට පොතුවිල් සිට ගිනිකොණ දෙසින් කි.මී 760 පමණ දුරින් උතුරු අක්ෂාංශ 5.2 ත් නැගෙනහිර දේශාංශ 88.5 ත් ආසන්නව ස්ථානගතව පවතී. මෙම පද්ධතිය ඉදිරි පැය 24 තුලදී චණ්ඩ සුළි කුණාටුවක් දක්වා වර්ධනය වේ යයි අනුමාන කෙරේ. මෙම පද්ධතිය ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළ තීරයට ඔබ්බෙන් වයඹ දෙසට ගමන් කර අප්‍රේල් මස 30 වන විට උතුරු තමිල්නාඩු වෙරල වෙත ගමන් කරනු ඇතැයි අනුමාන කෙරේ.

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් මේ සම්බන්ධව නිකුත් කරන ඉදිරි නිවේදන පිලිබඳ අවධානය යොමුකරන ලෙස මහජනතාවගෙන් සහ ධීවර හා නාවුක ප්‍රජාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

ගොඩබිම ප්‍රදේශ සඳහා:

මෙම සුළි කුණාටු පද්ධතියේ බලපෑම හේතුවෙන් දිවයින හරහා විශේෂයෙන් අප්‍රේල් මස 28 සිට 30 දක්වා දිනවලදී වැසි සහ සුළං තත්ත්වයේ වැඩිවීමක් අපේක්ෂා කෙරේ.

විශේෂයෙන් සබරගමුව, මධ්‍යම, දකුණු, බස්නාහිර, වයඹ, උතුරු සහ උතුරු-මැද පළාත්වල ඇතැම් ස්ථානවලට මි. මී. 100-150 ක පමණ තද වැසි ඇති විය හැකි අතර, සමහර ස්ථානවලට මි.මී. 150 ට වැඩි ඉතා තද වැසිද ඇති විය හැක (විශේෂයෙන් අප්‍රේල් 29-30 යන දින වල).

දිවයින හරහා පැ.කි.මී (50-60) දක්වා වන තද සුළං සමඟ විටින් විට හමන පැ.කි.මී 70 දක්වා වන ප්‍රහාරාත්මක සුළං බලාපොරොත්තුවේ.




EMERGENCY OPERATIONS DIVISION
RECEIVED
Date : 2019 - 04 - 27
Time : 1745 hrs
D (Ops)/DG/ADO
DISASTER MANAGEMENT CENTRE

මුහුදු ප්‍රදේශ සඳහා:

## 2019 අප්‍රේල් 27 දින මුහුදු ප්‍රදේශ සඳහා අනාවැකිය

- හම්බන්තොට සිට මඩකලපුව හරහා ත්‍රිකුණාමලය දක්වා වෙරළට ඔබ්බෙන් වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශවල පැ.කි.මී (30-40) දක්වා වන සුළං සමඟ විටින් විට හමන පැ.කි.මී (50-60) දක්වා වන ප්‍රභාරාත්මක සුළං බලාපොරොත්තුවේ. එම මුහුදු ප්‍රදේශ තරමක් රළු සිට රළු වේ.

- මධ්‍යම-නිරිත දිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශවල පැ.කි.මී (70-80) දක්වා වන සුළං සමඟ විටින් විට හමන පැ.කි.මී 90 දක්වා වන ප්‍රභාරාත්මක සුළං බලාපොරොත්තුවේ. එම මුහුදු ප්‍රදේශ ඉතා රළු සිට දළ රළු වේ.

## 2019 අප්‍රේල් 28 සහ 29 දින මුහුදු ප්‍රදේශ සඳහා අනාවැකිය

- නිරිත දිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශවල සහ නැගෙනහිර සහ ගිනිකොණ වෙරල තීරයට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල 28 වන දින උදෑසන පැ.කි.මී (90-100) දක්වා වන සුළං සමඟ විටින් විට හමන පැ.කි.මී 115 දක්වා වන ප්‍රභාරාත්මක සුළං බලාපොරොත්තුවේ.
- 29 වන දින නිරිත දිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශවල සහ නැගෙනහිර, ඊසාන සහ උතුරු වෙරල තීරයට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල සහ මන්නාරම් බොක්ක මුහුදු ප්‍රදේශවල පැ.කි.මී (120-130) දක්වා වන සුළං සමඟ විටින් විට හමන පැ.කි.මී 145 දක්වා වන ප්‍රභාරාත්මක සුළං බලාපොරොත්තුවේ.
- පුත්තලම සිට කොළඹ සහ ගාල්ල හරහා හම්බන්තොට දක්වා වන මුහුදු ප්‍රදේශවල 28 වන දින උදෑසන සිට පැ.කි.මී (35-45) දක්වා වන තද සුළං සමඟ විටින් විට හමන පැ.කි.මී (55-60) දක්වා වන ප්‍රභාරාත්මක සුළං බලාපොරොත්තුවේ.

## නාවුක සහ ධීවර ප්‍රජාව සඳහා නිවේදනය

- හම්බන්තොට සිට මඩකලපුව සහ ත්‍රිකුණාමලය හරහා කන්කසන්තුරය දක්වා වන මුහුදු ප්‍රදේශවල බොක්ක මුහුදු ප්‍රදේශවල නැවත දැනුම් දෙන තුරු ධීවර සහ නාවුක කටයුතු වලින් වලකින ලෙස ධීවරයන්ට උපදෙස් දෙනු ලැබේ.

- නිරිතදිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ උතුරු කොටසේ සිටින ධීවරයින් සහ නාවුකයින් ආරක්ෂිත මුහුදු ප්‍රදේශ වෙත ගමන් කරන ලෙස උපදෙස් දෙනු ලැබේ.

- සෙසු මුහුදු ප්‍රදේශවල ධීවර කටයුතු වල යෙදෙන ධීවරයින් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් මෙ සම්බන්ධව නිකුත් කරන ඉදිරි නිවේදන පිලිබඳ අවධානය යොමුකරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

Bulletin No: **06**
COLOR: **Amber**

WW/TC/19/04/27/06

## Advisory for Cyclonic Storm 'FANI'

Issued by the Natural Hazards Early Warning Centre
Issued at 05.00 p.m. 27th April 2019

### For Island and Deep and shallow sea areas to the east, southeast and north of Sri Lanka

**PLEASE BE AWARE!**

**The deep depression over southeast Bay of Bengal to the southeast of Sri Lanka, developed into a cyclonic storm named 'FANI' (pronounced as FONI) and was located near latitude 5.2N, Longitude 88.5E at 11.30 a.m. of 27th April 2019, about 760 km Southeast of Potuvil. It is likely to intensify further into a severe cyclonic storm during next 24 hours. The system is very likely to move northwestwards off east coast of Sri Lanka and reach north Tamilnadu coast (India) on 30th April 2019 evening.**

**General public, Naval and fishing communities are requested to be attentive about future advisories issued by the Department of Meteorology in this regard.**

**FOR LAND AREA:**

**Under the influence of this system showery and windy condition will enhance over the island during 28th April to 30th April 2019.**

**Showers or thundershowers at times with heavy falls about 100-150mm can be expected in the Sabaragamuwa, Central, Southern, Western, North-western, Northern and North-central provinces. Very heavy falls above 150mm can be expected at some places in the above mentioned areas too (especially during 29-30 April).**

**Strong winds (50-60) kmph, gusting up to 70kmph can be expected over the island.**




EMERGENCY OPERATIONS DIVISION
RECEIVED
Date : 2019 - 04 - 27
Time : 1745 hrs
D (Ops)/DO/ADO
DISASTER MANAGEMENT CENTRE

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

FOR SEA AREA:

Wind and sea condition forecast for 27th April 2019

- Wind speed will be (30-40) kmph in the deep and shallow Sea areas off the coast extending from Hambantota to Trincomalee via Batticaloa and can be fairly rough to rough at times as the wind speed can increase up to (50-60) kmph at times.

- Wind speed will be (70-80) kmph, gusting up to 90kmph over the Sea areas in the central part of south-west Bay of Bengal and can be very rough to high.

Wind and sea condition forecast for 28th and 29th April 2019

- Wind speed will be (90-100) kmph gusting to 115 kmph over Southwest Bay of Bengal & off eastern and south eastern coast from 28th morning;
- Wind speed will be (120-130) kmph gusting to 145 kmph over Southwest Bay of Bengal and sea area off the eastern, north-eastern and northern coast and Gulf of Mannar sea area on 29th.
- Wind speed will be (35-45) kmph, gusting up to (55-60)kmph can be expected over the sea area extending from Puttalam to Hambantota via Colombo and Galle from 28th morning.

## ADVISORY FOR NAVAL AND FISHING COMMUNITY

- The fishermen are advised not to venture into deep and swallow sea areas off the coast extending from Hambantota to Kankasanturai via Batticaloa and Trincomalee until further noticed.

- The fishermen, who are in deep Sea of South-west Bay of Bengal, are advised to move safer sea areas.

- The fishermen at other sea areas are requested to be attentive on future advisories issued by the Department of Meteorology in this regard.